පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

සතිය- පළමු සතිය

ශ්‍රේණිය - 9 ශ්‍රේණිය

Prepared by- කමනි ස්වර්ණමාලි- වටාපොත ම.වි.

- *මේ කාලය තුළ සෑම විෂයක්ම පුණරීක්ෂණයේ යෙදෙමින් අධ්‍යාපන කටයුතු වළ නිරතවීම ඔබගේ වගකීමකි.*
- *තෙවන පාඩමට අදාල කියවීම් පොත හා වැඩපොත අධ්‍යයනය කර පහත ක්‍රියාකාරකමෙහි නිරතවන්න.*
- *මෙම කාර්යය සඳහා ඔබට සතියක කාලයක් ලැබේ.*
- *ඔබේ පිළිතුරු හා නිර්මාණ **පළමු සතිය-ICT- ඔබේ නම හා ශ්‍රේණිය** ලියන ලද අමුණන ලද ගොනුවක් සේ සකස්කරන්න.*

01) පහත දී ඇති අවස්ථා අතරින් බහු කොන්දේසි සහිත තේරීමකට අදාළ අවස්ථා තෝරා එය A4 ප්‍රමාණයේ කොළයක වගුවක් ලෙස සකසන්න.

1) ශිෂ්‍ය නාමලේඛණය ලකුණු කිරීම.
2) දාදු කැටයක් උඩ දමා එහි වැටෙන අගය බැලීම.
3) සංඛ්‍යාවක් ඔත්තේ ද ඉරට්ටේ ද යන්න තේරීම.
4) වාර විභාගයකදී ශිෂ්‍යයෙකු ICT විෂයයට ලබාගත් ලකුණු මත පදනම්ව ඔහුට හිමි වන සාමාර්ථය A,B,C,S,W ලෙස තේරීම.
5) දෙන ලද සංඛ්‍යා 10 ක ඇති ඔත්තේ සංඛ්‍යා තේරීම.
6) පාසලක සිසුන් නිවාස වලට බෙදීම සඳහා ඔහුගේ හෝ ඇයගේ ඇතුලත් වීමේ අංකය 4න් බෙදා ඉතිරිය ලෙස 0 ලැබේනම් මෙත්තා නිවාසයටද, 1 ලැබේනම් මුදිතා නිවාසයටද, 2 ලැබේනම් කරුණා නිවාසයටද, 3 ලැබේනම් උපේක්ෂා නිවාසයටද වෙන්කිරීම.
7) සංඛ්‍යා 10ක එකතුව හා සාමාන්‍ය අගය තේරීම.
8) පුද්ගලයෙකුගේ ශරීර උෂ්ණත්වය මැන බලා උෂ්ණත්වමානයේ සටහන් වන පාඨාංකය මත පදනම්ව ඔහුගේ ශරීරය උණුසුම් ද , සීතල ද , සාමාන්‍ය තත්ත්වයේ ද යන්න බැලීම.
9) සංඛ්‍යා කිහිපයක එකතුව සෙවීම.
10) ශිෂ්‍යයෙකු එක්තරා විෂයයකට ලබාගත් ලකුණු මට්ටම 50 ට වැඩිනම් pass ලෙස ද 50 ට අඩුනම් fail ලෙසද දැක්වීම.

02) කියවීම් පොතෙහි පිටු අංක 31 හි ඇති දාදු කැටයක අගය ලබා ගැනීමට අදාළ ගැලීම් සටහන අධ්‍යයනය කර වාර විභාගයක දී ශිෂ්‍යයෙකු ICT විෂයයට ලබාගත් ලකුණු මත පදනම්ව ඔහුට හිමිවන සාමාර්ථය දැක්වීම සඳහා සුදුසු ගැලීම් සටහනක් ඔබගේ අභ්‍යාස පොතෙහි අඳින්න.

ලකුණු 75-100 - A
ලකුණු 65-74 - B
ලකුණු 50-64 - C
ලකුණු 36-49 - S
ලකුණු 0-35 - W